# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2019 අංක 24 දරන ක්‍රීඩාවලට සම්බන්ධ වැරදි වැළැක්වීමේ පනත

---

**[සහතිකය සටහන් කළේ 2019 නොවැම්බර් මස 18 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2019 නොවැම්බර් මස 22 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකි ය.

**මිල :** රු. 36.00 **තැපැල් ගාස්තුව :** රු. 35.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**2019 අංක 24 දරන ක්‍රීඩාවලට සම්බන්ධ වැරදි වැළැක්වීමේ පනත**

[සහතිකය සටහන් කළේ 2019 නොවැම්බර් මස 18 වන දින]

එල්.ඩී.—ඕ. 17/2014

**ක්‍රීඩාවල තරග පාවාදීම, දූෂණය, නීති විරෝධී මෙහෙයවීම සහ නීති විරෝධී ඔට්ටු ඇල්ලීම වැළැක්වීම සඳහා ද, වරදවල් විමර්ශනය කිරීම සඳහා විශේෂ විමර්ශන ඒකකයක් පත් කිරීම සඳහා ද සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

1. මේ පනත 2019 අංක 24 දරන ක්‍රීඩාවලට සම්බන්ධ වැරදි වැළැක්වීමේ පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

I වන කොටස

**පනතෙහි අරමුණු සහ පනතෙහි විධිවිධාන අදාළ වීම**

2. මේ පනතෙහි අරමුණු - පනතෙහි අරමුණු.

(අ) ක්‍රීඩාවල තරග පාවාදීම, දූෂණය, නීති විරෝධී මෙහෙයවීම සහ නීති විරෝධී ඔට්ටු ඇල්ලීම වැළැක්වීම;

(ආ) ක්‍රීඩාවල තරග පාවාදීම, දූෂණය, නීති විරෝධී මෙහෙයවීම සහ නීති විරෝධී ඔට්ටු ඇල්ලීම හා සම්බන්ධ තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා සහ ක්‍රීඩාවල යහපත් පරිචයන් ප්‍රවර්ධනය කිරීම සඳහා ක්‍රීඩා සංවිධාන, නීතිය බලාත්මක කිරීමේ නියෝජිතායතන සහ ඔට්ටු මෙහෙයුම්කරුවන් අතර ජාතික සහ අන්තර්ජාතික සහයෝගීතාවය ශක්තිමත් කිරීම;

(ඇ) ක්‍රීඩාවල තරග පාවාදීම, දූෂණය, නීති විරෝධී මෙහෙයවීම සහ නීති විරෝධී ඔට්ටු ඇල්ලීම හා සම්බන්ධ ගැටලු පිළිබඳව දැනුම්වත්භාවය ප්‍රවර්ධනය කිරීම සහ ආශ්‍රිත පාර්ශ්වයන් අතර සම්බන්ධීකරණය වර්ධනය කිරීම පිණිස වැඩසටහන් පැවැත්වීම;

(ඈ) ජාතික ක්‍රීඩාවල අවංකභාවය ආරක්ෂා කිරීම සහ පවත්වාගෙන යාම;

(ඉ) ක්‍රීඩාවල තරග පාවාදීමට, දූෂණයට, නීති විරෝධී මෙහෙයවීමට සහ නීති විරෝධී ඔට්ටු ඇල්ලීමට එරෙහිව වූ වැළැක්වීමේ පියවර නීතිය බලාත්මක කිරීමේ නියෝජිතායතන සමග ඒකාබද්ධව හඳුන්වා දීම සහ ප්‍රවර්ධනය කිරීම;

(ඊ) වෘත්තීය ක්‍රීඩකයන්ගේ කීර්තිනාමය සහ ජීවන වෘත්තිය ආරක්ෂා කිරීම; සහ

(උ) ක්‍රීඩාවල තරග පාවාදීම, දූෂණය, නීති විරෝධී මෙහෙයවීම සහ නීති විරෝධී ඔට්ටු ඇල්ලීම යන වැරදි සම්බන්ධයෙන් විමර්ශන සිදු කිරීම සඳහා ස්වාධීන, අපක්ෂපාතී විශේෂ විමර්ශන ඒකකයක් පත් කිරීම,

විය යුතු ය.

ලේකම්වරයා විසින් ගිවිසුම්වලට ඇතුළත් වීම ආදිය කළ හැකි බව.

3. මේ පනතේ අරමුණු ඉටු කර ගැනීමේ කාර්යය සඳහා ලේකම්වරයා විසින්, අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව-

(අ) ක්‍රීඩාවල යහපත් පරිචයන් ප්‍රවර්ධනය කිරීම සඳහා සහ ක්‍රීඩාවල වෘත්තීමය මට්ටම ඉහළ නැංවීම සඳහා යම් ජාතික හෝ ජාත්‍යන්තර ක්‍රීඩා සංවිධානයක් හෝ නීතිය බලාත්මක කිරීමේ නියෝජිතායතනයක් සමග මේ පනත යටතේ යම් ගිවිසුමකට හෝ අවබෝධතා ලියවිල්ලකට ඇතුළත් වීම; සහ

(ආ) යම් ජාතික හෝ ජාත්‍යන්තර ක්‍රීඩා සංවිධානයක් හෝ නීතිය බලාත්මක කිරීමේ නියෝජිතායතනයක් සමග ක්‍රීඩාවල තරග පාවාදීම, දූෂණය, නීති විරෝධී මෙහෙයවීම සහ නීති විරෝධී ඔට්ටු ඇල්ලීම හා සම්බන්ධ තොරතුරු හුවමාරු කර ගැනීම,

කළ හැකි ය.

## II වන කොටස

## I වන පරිච්ඡේදය

### ක්‍රීඩාවල තරග පාවාදීම, දූෂණය, නීති විරෝධී මෙහෙයවීම සහ නීති විරෝධී ඔට්ටු ඇල්ලීම යන වැරදි

ක්‍රීඩාවල තරග පාවාදීම යන වරද.

**4.** (1) (අ) යම් තැනැත්තකු විසින් හෝ යම් ක්‍රීඩාවකට සම්බන්ධ තැනැත්තකු විසින්-

(i) තමාට හෝ වෙනත් තැනැත්තකුට මුල්‍යමය හෝ වෙනත් යම් වාසියක් සිදු වන හෝ වෙනත් තැනැත්තකුට මුල්‍යමය අවාසියක් හෝ පාඩුවක් සිදු වන යම් ඔට්ටු ඇල්ලීමක, සූදු ක්‍රීඩාවක හෝ වෙනත් යම් ක්‍රියාකාරකමක නිරත වීමේ හේතුවෙන් යම් ක්‍රීඩාවක් හෝ ක්‍රීඩා ඉසව්වක් දූෂිත වන බව දනිමින් ඒ ඔට්ටු ඇල්ලීමෙහි, සූදු ක්‍රීඩාවෙහි හෝ ඒ ක්‍රියාකාරකමෙහි නිරත වන්නා වූ;

(ii) යම් ක්‍රීඩාවක් හෝ ක්‍රීඩා ඉසව්වක් හා සම්බන්ධ නීති විරෝධී ඔට්ටු ඇල්ලීමකට විෂයය වන යම් අනිසි ක්‍රියාකාරිත්වයක්, ක්‍රියාවක්, නොකර හැරීමක් හෝ ප්‍රතිඵලයක් සිදුවීම සහතික කෙරෙන අයුරින් ක්‍රියා කරන්නා වූ;

(iii) සද්භාවයෙන් සිදු කරනු ලබන මාධ්‍ය සම්මුඛ සාකච්ඡා සහ ඉටු කරනු ලබන වගකීම් සම්බන්ධයෙන් හැර, මුල්‍යමය හෝ වෙනත් යම් වාසියක්, ත්‍යාගයක් හෝ ප්‍රතිලාභයක් සඳහා යම් ක්‍රීඩාවක්, ක්‍රීඩා ඉසව්වක් හෝ යම් තැනැත්තකු සම්බන්ධයෙන් වූ යම් අභ්‍යන්තර තොරතුරක්, ඔට්ටු මෙහෙයුම්කරුවකුට ද ඇතුළුව, යම් තැනැත්තකුට සපයන්නා වූ;

(iv) ඒ තැනැත්තා හෝ යම් ක්‍රීඩාවක් හෝ ක්‍රීඩා ඉසව්වක් හෝ අපකීර්තියට පත්වෙතැයි සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකි, මුල්‍යමය හෝ අන්‍යාකාරයක වූ යම් ප්‍රදානයක්, ගෙවීමක්, ත්‍යාගයක් හෝ ප්‍රතිලාභයක් සපයන්නා වූ හෝ භාරගන්නා වූ; හෝ

(v) ඉහත දැක්වෙන ඡේදවල නිශ්චිතව සඳහන් කර ඇති යම් ක්‍රියාවකට ඍජුව හෝ වක්‍රව සම්බන්ධ වූ ද සහ යම් ක්‍රීඩාවකට හෝ ක්‍රීඩා ඉසව්වකට අගතිගාමී වූ ද යම් ක්‍රියාවක හෝ නොකර හැරීමක නිරත වන්නා වූ;

(ආ) යම් තනි ක්‍රීඩකයකු හෝ ක්‍රීඩකයන් කණ්ඩායමක් විසින්-

(i) යම් ක්‍රීඩාවක දී හෝ ක්‍රීඩා ඉසව්වක දී තනිව හෝ සාමූහිකව ක්‍රීඩා කුසලතාව අඩුවෙන් දැක්වීම සඳහා හෝ ව්‍යාජ හේතු මත ඒ ක්‍රීඩාවෙන් හෝ ක්‍රීඩා ඉසව්වෙන් ඉවත් වීම සඳහා මුදල් හෝ වෙනත් යම් ත්‍යාගයක් හෝ ප්‍රතිලාභයක් භාරගන්නා වූ; හෝ

(ii) ඒ ක්‍රීඩකයාගේ හෝ ක්‍රීඩකයන් කණ්ඩායමේ ක්‍රීඩා කුසලතාවට හානි කරමින්, ඒ ක්‍රීඩකයා හෝ ක්‍රීඩකයන් කණ්ඩායම ක්‍රීඩා කරන ක්‍රීඩාව හෝ ක්‍රීඩා ඉසව්ව සම්බන්ධයෙන් ඔට්ටු අල්ලන්නා වූ;

(ඇ) යම් විනිසුරුවරයකු, තරග විනිශ්චයකාරවරයකු හෝ තරග තීරකවරයකු විසින් මුදල් හෝ වෙනත් යම් ත්‍යාගයක් හෝ ප්‍රතිලාභයක් සඳහා යම් ක්‍රීඩාවක හෝ ක්‍රීඩා ඉසව්වක රීති සිතාමතාම වැරදි ලෙස යොදන්නා වූ;

(ඈ) යම් ක්‍රීඩාංගණ භාරකරුවකු හෝ යම් ක්‍රීඩාංගණ කාර්ය මණ්ඩලයක හෝ ක්‍රීඩා පිටි කාර්ය මණ්ඩලයක හෝ සහාය කාර්ය මණ්ඩලයක යම් සාමාජිකයකු විසින්-

(i) ඔට්ටු මෙහෙයුම්කරුවකු ද ඇතුළුව යම් තැනැත්තකුගේ මනාපය පරිදි යම් ක්‍රීඩාවක හෝ ක්‍රීඩා ඉසව්වක, යම් තණතිල්ලක්, ක්‍රීඩා පිටියක් හෝ ක්‍රීඩා පිටියක මතුපිට සකස් කිරීමට; හෝ

(ii) යම් ක්‍රීඩාවක හෝ ක්‍රීඩා ඉසව්වක තණතිල්ල හෝ ක්‍රීඩා පිටිය හෝ ක්‍රීඩා පිටියේ මතුපිට

සකසා ඇති ආකාරය සහ ඒ තණතිල්ලෙහි, ක්‍රීඩා පිටියෙහි හෝ ක්‍රීඩා පිටියේ මතුපිටෙහි තත්ත්වය පිළිබඳ තොරතුරු හෙළිදරව් කිරීමට,

මුදල් හෝ වෙනත් යම් ත්‍යාගයක් හෝ ප්‍රතිලාභයක් භාරගන්නා වූ; හෝ

(ඉ) වෙනත් යම් තැනැත්තකු විසින්, මුදල් හෝ වෙනත් යම් ත්‍යාගයක් හෝ ප්‍රතිලාභයක් සඳහා දේශීය හෝ විදේශීය ක්‍රීඩකයන්ගේ ක්‍රීඩා කුසලතාවට බලපෑම් කිරීම පිණිස ඒ ක්‍රීඩකයන් වෙත ප්‍රවේශ වීම සඳහා විශ්‍රාමික ක්‍රීඩකයකු ද ඇතුළුව යම් තැනැත්තකු හෝ යම් ක්‍රීඩාවකට සම්බන්ධ තැනැත්තකු යොදාගන්නා වූ,

යම් වැඩපිළිවෙළක් ද ඇතුළත්ව, ඍජුව හෝ වක්‍රව, තනිව හෝ වෙනත් අයකු හෝ වෙනත් අය සමග එක්ව, මුදල් හෝ වෙනත් යම් ත්‍යාගයක් හෝ ප්‍රතිලාභයක් සඳහා යම් ක්‍රීඩාවක හෝ ක්‍රීඩා ඉසව්වක සාමාන්‍ය ක්‍රියාවලියෙහි හෝ එහි ප්‍රතිඵලයෙහි අවිධිමත් වෙනස් කිරීමක් පිළිබඳ යම් වැඩපිළිවෙළකට සම්බන්ධ වන යම් තැනැත්තකු හෝ යම් ක්‍රීඩාවකට සම්බන්ධ තැනැත්තකු ක්‍රීඩාවල තරග පාවාදීම යන වරද සිදු කරන්නේ ය.

(2) (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ සිට (ඉ) ඡේදය දක්වා වූ ඡේදවල නිශ්චිතව දක්වා ඇති කවර හෝ ක්‍රියාවක් සිදු කිරීම මගින්, ඍජුව හෝ වක්‍රව, තනිව හෝ වෙනත් අයකු හෝ වෙනත් අය සමග එක්ව, යම් ක්‍රීඩා තරගාවලියක සාමාන්‍ය ක්‍රියාවලියෙහි හෝ එහි ප්‍රතිඵලයෙහි අවිධිමත් වෙනස් කිරීමක් පිළිබඳ යම් වැඩපිළිවෙළකට සම්බන්ධ වන යම් තැනැත්තකු හෝ යම් ක්‍රීඩාවකට සම්බන්ධ තැනැත්තකු ක්‍රීඩාවල තරගාවලි පාවාදීම යන වරද සිදු කරන්නේ ය.

ක්‍රීඩාවල දූෂණය යන වරද.

**5.** යම් ක්‍රීඩාවක හෝ ක්‍රීඩා ඉසව්වක ප්‍රතිඵලයට, ප්‍රගතියට, පැවැත්මට හෝ වෙනත් යම් අංගයකට බලපෑම් කිරීම සඳහා-

(අ) මුදල් හෝ වෙනත් යම් ත්‍යාගයක් හෝ ප්‍රතිලාභයක් අයැදින හෝ පිළිගනු ලබන හෝ පිළිගැනීමට එකඟ වන, නැතහොත් පිරිනමන;

(ආ) වංක ලෙස හෝ වංචනික ලෙස, ස්වකීය වාසිය පිණිස හෝ වෙනත් තැනැත්තකුගේ වාසිය පිණිස වෙනත් යම් තැනැත්තකු හෝ දෙයක් පාලනය කරන; හෝ

(ඇ) යම් ක්‍රියාවක් කිරීමට හෝ යම් ක්‍රියාවක් කිරීමෙන් වැළකී සිටීමට, සෘජුව හෝ වක්‍රව, යම් තැනැත්තකුගෙන් අයැදින, යම් තැනැත්තකු පොලඹවන හෝ කැමති කරවා ගන්නා හෝ යම් තැනැත්තකුට ඒත්තු ගන්වන හෝ උපදෙස් දෙන,

යම් තැනැත්තකු හෝ යම් ක්‍රීඩාවකට සම්බන්ධ තැනැත්තකු ක්‍රීඩාවල දූෂණය යන වරද සිදු කරන්නේ ය.

ක්‍රීඩාවල නීති විරෝධී මෙහෙයවීම යන වරද.

**6.** යම් ක්‍රීඩාවක හෝ ක්‍රීඩා ඉසව්වක ප්‍රතිඵලයට, ප්‍රගතියට, පැවැත්මට හෝ වෙනත් යම් අංගයකට අනිසි ලෙස, අසාධාරණ ලෙස හෝ වංක ලෙස බලපෑම් කරන යම් තැනැත්තකු හෝ යම් ක්‍රීඩාවකට සම්බන්ධ තැනැත්තකු ක්‍රීඩාවල නීති විරෝධී මෙහෙයවීම යන වරද සිදු කරන්නේ ය.

ක්‍රීඩාවල නීති විරෝධී ඔට්ටු ඇල්ලීම යන වරද.

**7.** යම් ක්‍රීඩාවක් හෝ ක්‍රීඩා ඉසව්වක් හා සම්බන්ධ යම් තොරතුරක් අභ්‍යන්තර තොරතුරක් බව හෝ නීති විරෝධී දූෂිත චර්යාවක් පිළිබඳ තොරතුරක් බව දැනුම සහිතව ඒ තොරතුර සන්තකව සිටිමින්-

(අ) ඒ ක්‍රීඩාව හෝ ක්‍රීඩා ඉසව්ව පිළිබඳව ඔට්ටු අල්ලන;

(ආ) ඒ ක්‍රීඩාව හෝ ක්‍රීඩා ඉසව්ව පිළිබඳව යම් නිශ්චිත ආකාරයකට ඔට්ටු ඇල්ලීමට වෙනත් තැනැත්තකුට අනුබල දෙන; හෝ

(ඇ) ඒ ක්‍රීඩාව හෝ ක්‍රීඩා ඉසව්ව පිළිබඳව ඔට්ටු අල්ලන බවට හෝ ඔට්ටු ඇල්ලීමට ඉඩ ඇති බවට දන්නා හෝ සාධාරණව දැන සිටිය යුතු වෙනත් තැනැත්තකුට ඒ තොරතුර සන්නිවේදනය කරන,

යම් තැනැත්තකු හෝ යම් ක්‍රීඩාවකට සම්බන්ධ තැනැත්තකු ක්‍රීඩාවල නීති විරෝධී ඔට්ටු ඇල්ලීම යන වරද සිදු කරන්නේ ය.

8. (අ) 4 වන, 5 වන, 6 වන හෝ 7 වන වගන්තියෙහි නිශ්චිතව දක්වා ඇති යම් වරදක් සිදු කිරීමට ආධාර දෙන, අනුබල දෙන, තැත් කරන හෝ කුමන්ත්‍රණය කරන; හෝ

ආධාර දීම, අනුබල දීම, තැත් කිරීම ආදිය වරදක් බව.

(ආ) 4 වන, 5 වන, 6 වන හෝ 7 වන වගන්තියෙහි නිශ්චිතව දක්වා ඇති යම් වරදක් සිදු කිරීමට යම් ක්‍රීඩාවකට සම්බන්ධ තැනැත්තකු වෙත ප්‍රවේශවන, පොළඹවන, බලපෑම් කරන හෝ ඒ තැනැත්තකුට හැකියාව ඇති කරන හෝ පහසුකම් සලසන,

යම් තැනැත්තකු වරදක් සිදු කරන්නේ ය.

9. 4 වන, 5 වන, 6 වන, 7 වන හෝ 8 වන වගන්තියෙහි නිශ්චිතව දක්වා ඇති වරදක් සිදු කරන යම් තැනැත්තකු වරදකරු කරනු ලැබීමේ දී, රුපියල් මිලියන සියයකට වැඩි නොවන දඩයකට හෝ අවුරුදු දහයක් නො ඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

4 වන, 5 වන, 6 වන, 7 වන හෝ 8 වන වගන්තිය යටතේ වන වරදක් සඳහා දණ්ඩනය.

## II වන පරිච්ඡේදය

## වෙනත් වැරදි

10. 16 වන හෝ 18 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීම පැහැර හරින යම් තැනැත්තකු හෝ යම් ක්‍රීඩාවකට සම්බන්ධ තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදු කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබීමේ දී රුපියල් ලක්ෂ දෙකකට වැඩි නොවන දඩයකට හෝ අවුරුදු තුනක් නො ඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

තොරතුරු හෙළිදරව් කිරීම පැහැර හැරීම වරදක් බව.

11. (අ) මේ පනත යටතේ වූ යම් වරදක් හා සම්බන්ධ විමර්ශනයක දී ලේකම්වරයාට, ක්‍රීඩා අධ්‍යක්ෂවරයාට, ඒකකයට හෝ ඒකකය විසින් බලය පවරන ලද යම් තැනැත්තකුට සිතාමතාම බාධා කරන, අවහිර කරන හෝ සහයෝගය දැක්වීම පැහැර හරින;

විමර්ශනයක් සම්බන්ධයෙන් සහයෝගය දැක්වීම ආදිය පැහැර හැරීම වරදක් බව.

(ආ) මේ පනත යටතේ පවත්වනු ලබන යම් විමර්ශනයක කාර්යය සඳහා ඒකකය ඉදිරිපිට පැමිණ පෙනී සිටින ලෙස ඒකකය විසින් නියම කරනු ලැබ, සාධාරණ හේතුවක් නොමැතිව එසේ පෙනී සිටීම පැහැර හරින;

(ඇ) ඒකකය විසින් විමර්ශනය කරනු ලබන යම් කාරණයක් සම්බන්ධයෙන් ඒකකය විසින් නඟන යම් ප්‍රශ්නයකට පිළිතුරු දීම සාධාරණ හේතුවක් නොමැතිව ප්‍රතික්ෂේප කරන හෝ පැහැර හරින;

(ඈ) මේ පනත යටතේ ඒකකය විසින් තමා වෙත නිකුත් කරන ලද දැන්වීමක අවශ්‍යතාවයන්ට අනුකූලව කටයුතු කිරීම සාධාරණ හේතුවක් නොමැතිව ප්‍රතික්ෂේප කරන හෝ පැහැර හරින;

(ඉ) මේ පනත යටතේ වූ යම් විමර්ශනයක කාර්යය සඳහා යම් තොරතුරක්, වාර්තාවක් හෝ ලේඛනයක් සපයන ලෙසට ඒකකය විසින් තමා වෙත කරන ලද ඉල්ලීමකට අනුකූලව ඒ තොරතුර, වාර්තාව හෝ ලේඛනය සැපයීම පැහැර හරින;

(ඊ) මේ පනත යටතේ සිදු කරන යම් විමර්ශනයක කාර්යය සඳහා ඒකකය විසින් යම් තොරතුරක්, වාර්තාවක් හෝ ලේඛනයක් සපයන ලෙස හෝ යම් ප්‍රකාශයක් කරන ලෙස තමාගෙන් ඉල්ලා සිටි විට දැන දැනම සාවද්‍ය, අසම්පූර්ණ හෝ නොමඟ යවන සුලු තොරතුරක්, වාර්තාවක් හෝ ලේඛනයක් සපයන හෝ දැන දැනම සාවද්‍ය ප්‍රකාශයක් කරන; හෝ

(උ) යම් තොරතුරක්, වාර්තාවක්, ලේඛනයක් හෝ ද්‍රව්‍යයක් මේ පනත යටතේ සිදු කරන විමර්ශනයකට අදාළ වන බව දැන දැනම හෝ එසේ අදාළ වන බව විශ්වාස කිරීමට හේතු තිබිය දී එම තොරතුර, වාර්තාව, ලේඛනය හෝ ද්‍රව්‍යය සඟවන, වෙනස් කරන, විනාශ කරන හෝ අන්‍යාකාරයකින් බැහැර කරන හෝ සැඟවීමට, වෙනස් කිරීමට, විනාශ කිරීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට සලස්වන හෝ ඉඩදෙන,

යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදු කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබීමේ දී රුපියල් ලක්ෂ දෙකකට වැඩි නොවන දඩයකට හෝ අවුරුදු තුනක් නො ඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

**12.** රහස්‍යභාවය ආරක්ෂා කිරීම සඳහා 32 වන වගන්තිය මගින් යම් තැනැත්තකු වෙත පවරනු ලැබ ඇති යුතුකම උල්ලංඝනය කරමින් ක්‍රියා කරන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදු කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබීමේ දී රුපියල් ලක්ෂ පහකට වැඩි නොවන දඩයකට හෝ අවුරුදු දහයක් නො ඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

සේවා සපයන්නකු විසින් රහස්‍යභාවය ආරක්ෂා කිරීම පැහැර හැරීම වරදක් බව.

13. මේ පනතේ 16 වන වගන්තිය යටතේ හෙළිදරව් කරනු ලබන යම් තොරතුරක ඇතුළත් යම් චෝදනාවක අන්තර්ගතය සාවද්‍ය බව දැන දැනම හෝ, ඒ චෝදනාව සත්‍ය නොවන බව විශ්වාස කිරීමට හේතු තිබිය දී ඒ තොරතුර මගින් යම් සාවද්‍ය චෝදනාවක් කරන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදු කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබීමේ දී රුපියල් ලක්ෂ එකකට වැඩි නොවන දඩයකට හෝ අවුරුදු තුනක් නො ඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

සාවද්‍ය චෝදනා එල්ල කිරීම වරදක් බව.

**14.** මේ පනත යටතේ වූ යම් වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කරනු ලැබූ අවස්ථාවක දී, ඒ පුද්ගල මණ්ඩලය-

පුද්ගල මණ්ඩලයක් විසින් කරන වැරදි.

(අ) සංස්ථාගත මණ්ඩලයක් නම්, එවිට, ඒ වරද සිදු කරන ලද අවස්ථාවේ දී ඒ සංස්ථාගත මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකු, කළමනාකරුවකු, නිලධරයකු හෝ සේවකයකු වූ සෑම තැනැත්තකු ම;

(ආ) හවුල් ව්‍යාපාරයක් නම්, එවිට, ඒ වරද සිදු කරන ලද අවස්ථාවේ දී ඒ හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවකු වූ සෑම තැනැත්තකු ම; හෝ

(ඇ) හවුල් ව්‍යාපාරයක් නොවන සංස්ථාගත නො කරන ලද මණ්ඩලයක් නම්, එවිට, ඒ වරද සිදු කරන ලද අවස්ථාවේ දී ඒ මණ්ඩලයේ සාමාජිකයකු වූ සෑම පුද්ගලයකු ම සහ ඒ මණ්ඩලයේ කළමනාකරණය සහ පාලනය සඳහා වගකිව යුතු සෑම නිලධරයකු ම,

ඒ වරද තමාගේ අනුදැනුමකින් තොරව සිදු කරනු ලැබ ඇති බවට හෝ ඒ වරද සිදු කිරීම වැළැක්වීමට අවශ්‍ය සම්පූර්ණ නිසි

උද්‍යෝගයෙන් තමා කටයුතු කළ බවට අවස්ථාවෝචිත පරිදි, ඒ තැනැත්තා, පුද්ගලයා හෝ නිලධරයා විසින් ඔප්පු කරන්නේ නම් මිස, ඒ වරද සිදු කරන ලද සේ සලකනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපනය.

**15.** මේ කොටසේ කාර්ය සඳහා-

(අ) ''දූෂිත චර්යාවක් පිළිබඳ තොරතුර'' යන්නෙන්, යම් ක්‍රීඩාවක හෝ ක්‍රීඩා ඉසව්වක ප්‍රතිඵලය දූෂිත බවට පත් කරන චර්යාවක් හෝ අපේක්ෂිත චර්යාවක් හා සම්බන්ධ තොරතුරක් අදහස් වේ;

(ආ) ''අභ්‍යන්තර තොරතුර'' යන්නෙන්, සාමාන්‍යයෙන් ලබා ගත නොහැකි තොරතුරක් සහ සාමාන්‍යයෙන් ලබාගත හැකි තොරතුරක් වූයේ නම්, පොදුවේ යම් ක්‍රීඩාවක් හෝ ක්‍රීඩා ඉසව්වක් සම්බන්ධයෙන් ඔට්ටු අල්ලන යම් තැනැත්තකුට ඒ ක්‍රීඩාව හෝ ක්‍රීඩා ඉසව්ව සම්බන්ධයෙන් ඔට්ටු ඇල්ලිය යුතු ද නැද්ද යන්න තීරණය කිරීමට හෝ වෙනත් යම් ඔට්ටු ඇල්ලීමේ තීරණයක් ගැනීමට බලපෑමක් ඇති කරන හෝ බලපෑමක් ඇති කිරීමට ඉඩ ඇති තොරතුරක් අදහස් වේ; සහ

(ඇ) ''ආධාර දීම'', ''අනුබල දීම'', ''තැත් කිරීම'' සහ ''කුමන්ත්‍රණය කිරීම'' යන යෙදුම්වලට (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ ඒ යෙදුම්වලට දී ඇති අර්ථය ම තිබිය යුතු ය.

## III වන කොටස

## තොරතුරු හෙළිදරව් කිරීම

ලේකම්වරයා ආදීන් වෙත තොරතුරු හෙළිදරව් කිරීම.

**16.** (1) (අ) යම් තැනැත්තකු 4 වන, 5 වන, 6 වන, 7 වන හෝ 8 වන වගන්තිය යටතේ වූ වරදක් සංස්ථාපනය වන යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් කිරීම හෝ සිදු කිරීම පිණිස යම් තැනැත්තකු වෙත හෝ යම් ක්‍රීඩාවකට සම්බන්ධ තැනැත්තකු වෙත ප්‍රවේශ වන, ඒ යම් තැනැත්තකු පොලඹවන හෝ ඒ යම් තැනැත්තකුට තර්ජනය කරනු ලබන අවස්ථාවක; හෝ

(ආ) 4 වන, 5 වන, 6 වන, 7 වන හෝ 8 වන වගන්තිය යටතේ වූ වරදක් සංස්ථාපනය වන යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක්-

(i) යම් තැනැත්තකු හෝ යම් ක්‍රීඩාවකට සම්බන්ධ තැනැත්තකු කර ඇති බව හෝ සිදු කර ඇති බව;

(ii) කිරීම හෝ සිදු කිරීම පිණිස යම් තැනැත්තකු වෙත හෝ යම් ක්‍රීඩාවකට සම්බන්ධ තැනැත්තකු වෙත ප්‍රවේශයක් සිදු වී ඇති බව, ඒ යම් තැනැත්තකු පොලඹවනු ලැබ ඇති බව හෝ ඒ යම් තැනැත්තකුට තර්ජනය කරනු ලැබ ඇති බව; හෝ

(iii) කිරීම හෝ සිදු කිරීම පිණිස යම් තැනැත්තකුට හෝ යම් ක්‍රීඩාවකට සම්බන්ධ තැනැත්තකුට සෘජු හෝ වක්‍ර තර්ජන එල්ල වී ඇති බව,

යම් තැනැත්තකුට හෝ යම් ක්‍රීඩාවකට සම්බන්ධ තැනැත්තකුට දැන ගැනීමට ලැබෙන අවස්ථාවක හෝ විශ්වාස කිරීමට හේතු ඇති අවස්ථාවක, නැතහොත් ඒ බව යම් තැනැත්තකු හෝ යම් ක්‍රීඩාවකට සම්බන්ධ තැනැත්තකු සාධාරණ ලෙස සැක කරන අවස්ථාවක,

ඒ තැනැත්තා හෝ ඒ යම් ක්‍රීඩාවකට සම්බන්ධ තැනැත්තා විසින් ඒ තොරතුර ලිඛිතව, පැමිණීමෙන් හෝ ඉලෙක්ට්‍රොනික ක්‍රමයකින් ලේකම්වරයා හෝ ක්‍රීඩා අධ්‍යක්ෂවරයා හෝ මේ පනතේ 21 වන වගන්තිය යටතේ පත් කරනු ලබන ඒකකය වෙත වහාම හෙළිදරව් කරනු ලැබිය යුතු ය.

(2) යම් තැනැත්තකු විසින් සිදු කරනු ලබන ඔට්ටු ඇල්ලීම්වල යම් අසාමාන්‍ය රටා පිළිබඳව යම් ඔට්ටු මෙහෙයුම්කරුවකුට දැන ගැනීමට ලැබෙන අවස්ථාවක හෝ යම් ඔට්ටු මෙහෙයුම්කරුවකු සාධාරණ ලෙස සැක කරන අවස්ථාවක, ඒ ඔට්ටු මෙහෙයුම්කරු විසින් ඒ තොරතුර ලිඛිතව, පැමිණීමෙන් හෝ ඉලෙක්ට්‍රොනික ක්‍රමයකින් ලේකම්වරයා හෝ ක්‍රීඩා අධ්‍යක්ෂවරයා හෝ ඒකකය වෙත වහාම හෙළිදරව් කරනු ලැබිය යුතු ය.

ලේකම්වරයා හෝ ක්‍රීඩා අධ්‍යක්ෂවරයා විසින් ඒකකය වෙත තොරතුරු යොමු කළ යුතු බව.

**17.** (1) 16 වන වගන්තිය යටතේ යම් තොරතුරක් ලැබුණු පසු, අවස්ථාවෝචිත පරිදි, ලේකම්වරයා හෝ ක්‍රීඩා අධ්‍යක්ෂවරයා විසින් ඒ තොරතුර විමර්ශනය කිරීම සඳහා ඒකකය වෙත යොමු කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, ඒ තොරතුර මගින්, (26 වන අධිකාරය වූ) අල්ලස් පනතේ 70 වන වගන්තිය යටතේ වූ වරදක් සිදු කිරීම පිළිබඳව හෙළිදරව් වන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, ලේකම්වරයා හෝ ක්‍රීඩා අධ්‍යක්ෂවරයා විසින් ඒ තොරතුර, විමර්ශනය කිරීමේ සහ නඩු පැවරීමේ කාර්යය සඳහා, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත යොමු කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුවද, ලේකම්වරයා හෝ ක්‍රීඩා අධ්‍යක්ෂවරයා විසින් ස්වකීය පෙලඹවීමෙන් ම මේ පනත යටතේ වූ යම් වරදක් හා සම්බන්ධ යම් තොරතුරක්, විමර්ශනය කිරීම සඳහා ඒකකය වෙත යොමු කරනු ලැබිය හැකි ය.

ඔට්ටු මෙහෙයුම්කරුවන් සමග පවත්නා සම්බන්ධතා ලේකම්වරයාට හෝ ක්‍රීඩා අධ්‍යක්ෂවරයාට හෙළිදරව් කිරීම.

**18.** (1) යම් ක්‍රීඩාවකට සම්බන්ධ තැනැත්තකුට යම් ඔට්ටු මෙහෙයුම්කරුවකු සමග යම් පෞද්ගලික හෝ ව්‍යාපාරික බැඳියාවන් හෝ වෙනත් යම් සම්බන්ධතා ඇතොත් ඒ බැඳියාවන් හෝ සම්බන්ධතා පිළිබඳ හෝ ඒ යම් තැනැත්තකුට ක්‍රීඩා සම්බන්ධයෙන් යම් පෞද්ගලික හෝ ව්‍යාපාරික බැඳියාවන් ඇතොත් ඒ බැඳියාවන් පිළිබඳ හෝ සියලු තොරතුරු ඒ තැනැත්තා විසින් ලේකම්වරයා හෝ ක්‍රීඩා අධ්‍යක්ෂවරයා වෙත හෙළිදරව් කරනු ලැබිය යුතු ය.

(2) අවස්ථාවෝචිත පරිදි, ලේකම්වරයා හෝ ක්‍රීඩා අධ්‍යක්ෂවරයා විසින්, ඒකකය විසින් කරනු ලබන ඉල්ලීමක් මත, (1) වන උපවගන්තිය යටතේ ඒ ලේකම්වරයා හෝ ක්‍රීඩා අධ්‍යක්ෂවරයා වෙත ලැබුණු යම් තොරතුරක් මේ පනත යටතේ වූ වරදක් පිළිබඳ යම් විමර්ශනයක කාර්යය සඳහා ඒකකය වෙත ලබාදිය යුතු ය.

## IV වන කොටස

## වරදවල් විමර්ශනය කිරීම සහ නඩු පැවරීම

මේ පනත යටතේ වන වැරදි අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ විධිවිධාන යටතේ විමර්ශනය කරනු ලැබිය යුතු බව.

**19.** (1) මේ පනතේ අන්‍යාකාරයකින් විධිවිධාන සලස්වා ඇති පරිදි හැර, මේ පනත යටතේ වන සියලු වැරදි විමර්ශනය කිරීම, විභාග කිරීම හෝ අන්‍යාකාරයකින් සුදුස්සක් කිරීම අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ විධිවිධානවලට අනුකූලව කරනු ලැබිය යුතු ය.

(2) අවස්ථානුගත කරුණු මත අන්‍යාකාරයකින් සිදු කිරීම අවශ්‍ය වන අවස්ථාවක දී හැර, ඒකකය විසින් මේ පනත යටතේ සිදු කරනු ලබන සියලු විමර්ශන රහස්‍යව සිදු කරනු ලැබිය යුතු ය.

II වන කොටසේ I වන පරිච්ඡේදය යටතේ වන වරදක් සංඥෙය වරදක් සහ ඇප දිය නොහැකි වරදක් විය යුතු බව.

**20.** මේ පනතේ II වන කොටසේ I වන පරිච්ඡේදය යටතේ වන යම් වරදක්, අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා සංඥෙය වරදක් සහ ඇප දිය නොහැකි වරදක් විය යුතු ය.

විශේෂ විමර්ශන ඒකකය පත් කිරීම.

**21.** (1) මේ පනත යටතේ වන යම් වරදක් සම්බන්ධයෙන් විමර්ශනයක් පැවැත්වීම සඳහා, අමාත්‍යවරයා විසින් පොලිස් දෙපාර්තමේන්තුව පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විමසා, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන සහකාර පොලිස් අධිකාරීවරයකුගේ නිලයට අඩු නොවන නිලයක් දරන පොලිස් නිලධරයන් සංඛ්‍යාවකින් සමන්විත ස්වාධීන, අපක්ෂපාතී (මේ පනතෙහි ''ඒකකය'' යනුවෙන් සඳහන් කරනු ලබන) විශේෂ විමර්ශන ඒකකයක් පත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරනු ලැබිය යුතු පොලිස් නිලධරයන් පොලිස්පතිවරයා විසින් නම් කරනු ලැබිය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින්, ඒකකයේ සාමාජිකයන් අතුරින් ජ්‍යෙෂ්ඨතම සාමාජිකයා ඒකකයේ ප්‍රධානයා ලෙස පත් කරනු ලැබිය යුතු ය.

(4) ඒකකයේ යම් සාමාජිකයකුගේ ධුර කාලය අවුරුදු තුනක් විය යුතු අතර, ඒකකයේ සාමාජිකයකු නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු විය යුතු ය.

(5) ඒකකයේ සාමාජිකයකු විසින් අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් ඕනෑම අවස්ථාවක සිය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, අමාත්‍යවරයා විසින් ඒ ලිපිය පිළිගනු ලබන දිනයේ සිට ඒ ඉල්ලා අස්වීම බලාත්මක විය යුතු ය.

(6) අමාත්‍යවරයා විසින්, එසේ කිරීම සුදුසු යයි තමා කල්පනා කරන්නේ නම්, හේතු දක්වා, ඒකකයේ යම් සාමාජිකයකු ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(7) ඒකකයේ යම් සාමාජිකයකු මිය යාම, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම හේතු කොට හෝ අන්‍යාකාරයකින් ඒකකයේ සාමාජික සංඛ්‍යාවෙහි යම් පුරප්පාඩුවක් සිදු වූ අවස්ථාවක දී, අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තියෙහි විධිවිධාන කෙරෙහි සැලකිලිමත් වෙමින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය.

(8) ඒකකයේ යම් සාමාජිකයකු මිය යාම, ඉල්ලා අස්වීම, ධුරයෙන් ඉවත් කිරීම හේතු කොට හෝ අන්‍යාකාරයකින් ඇති වූ පුරප්පාඩුවක් පිරවීම සඳහා වෙනත් තැනැත්තකු පත් කරනු ලබන අවස්ථාවක, එසේ පත් කරනු ලබන තැනැත්තා අනුප්‍රාප්ත වනුයේ යම් සාමාජිකයකු වෙනුවෙන් ද ඒ සාමාජිකයාගේ ධුර කාලයෙහි ඉකුත් නොවී ඇති ධුර කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

(9) අමාත්‍යවරයා විසින්, මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අදහස් විමසා නිශ්චය කරනු ලැබිය හැකි යම් පාරිශ්‍රමික ඒකකයේ සෑම සාමාජිකයකුට ම ගෙවනු ලැබිය යුතු ය.

(10) මේ පනත යටතේ වන ස්වකීය බලතල හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හා ඉටු කිරීමේ දී ඒකකයේ සාමාජිකයන්-

(අ) නියම කරනු ලැබිය හැකි පත්වීමේ කොන්දේසිවලට යටත් විය යුතු ය; සහ

(ආ) මේ පනත යටතේ සිදු කරනු ලබන යම් විමර්ශනයක් සම්බන්ධයෙන්, පොලිස්පතිවරයාගේ අධීක්ෂණයට, පාලනයට හෝ සුපරීක්ෂණයට යටත් නො විය යුතු ය:

එසේ වුව ද, ඒකකයේ සාමාජිකයන්ගේ විනය පාලන කටයුතු සිදු කිරීමට හෝ ස්ථාන මාරු සිදු කිරීමට පොලිස්පතිවරයාට බලය තිබිය යුතු ය.

(11) ඒකකය සියලු අවස්ථාවන්හි දී ස්වාධීනව සහ අපක්ෂපාතීව කටයුතු කළ යුතු ය.

22. (1) අමාත්‍යවරයා විසින්, 21 වන වගන්තිය යටතේ යම් පොලිස් නිලධරයකු ඒකකයේ සාමාජිකයකු ලෙස පත් කිරීමට පෙරාතුව ඒ නිලධරයා ඒකකයේ සාමාජිකයකු ලෙස ස්වකීය කාර්යයන් ඉටු කිරීමේ දී අගතිදායක ලෙස බලපෑමක් ඇති කිරීමට ඉඩ ඇති කිසිදු මූල්‍යමය, පෞද්ගලික හෝ වෙනත් බැඳියාවක් හෝ සබඳතාවක් මේ පනත යටතේ විමර්ශනයට ලක්ව ඇති යම් කාරණයක් සම්බන්ධයෙන් ඒ නිලධරයාට නොමැති බවට සෑහීමට පත් විය යුතු ය.

බැඳියාවන් පිළිබඳ ගැටීම් හෙළිදරව් කිරීම.

(2) ඒකකයේ සාමාජිකයකු විසින්-

(අ) ඒ සාමාජිකයා ඒකකයේ සාමාජිකයකු ලෙස පත් කරනු ලබන අවස්ථාවේ දී පවතින; හෝ

(ආ) මේ පනත යටතේ විමර්ශනය කරනු ලබන යම් කාරණයක් හෝ තැනැත්තකු සම්බන්ධයෙන් සිදු කරන යම් විමර්ශනයක් අතරතුර පැන නඟින හෝ පැන නැඟීමට ඉඩ ඇති,

බැඳියාවන් හෝ සම්බන්ධතා පිළිබඳ ගැටීමක් ඇති වන කවර හෝ අවස්ථාවක් පිළිබඳව අමාත්‍යවරයා වෙත සහ පොලිස්පතිවරයා වෙත හෙළිදරව් කළ යුතු ය.

23. (1) ඒකකය විසින්-

ඒකකය විසින් වැරදි විමර්ශනය කිරීම.

(අ) 16 වන වගන්තිය හෝ 17 වන වගන්තිය යටතේ යම් තොරතුරක් ලැබුණු විට ඒ තොරතුර විශ්වසනීය බවට සහ විමර්ශනයක් පැවැත්විය යුතු කරුණු ඒ තොරතුර මගින් හෙළිදරව් වන බවට ඒකකය සෑහීමට පත් වන්නේ නම්; හෝ

(ආ) මේ පනත යටතේ වන යම් වරදක් සිදු කිරීම පිළිබඳව බැලූ බැල්මට පෙනෙන සාක්ෂි ඇති බවට ඒකකයේ ප්‍රධානයා සෑහීමට පත් වන්නේ නම්, ස්වකීය පෙලඹවීමෙන් ම,

මේ පනත යටතේ වන යම් වරදක් සම්බන්ධයෙන් අපරාධ නඩු පැවරීමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි යම් විමර්ශන සිදු කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, ඒ තොරතුර හෝ සාක්ෂි මගින්, (26 වන අධිකාරය වූ) අල්ලස් පනතේ 70 වන වගන්තිය යටතේ වූ වරදක් සිදු කිරීම පිළිබඳව හෙළිදරව් වන අවස්ථාවක, ඒකකය විසින් ඒ තොරතුර හෝ සාක්ෂි, විමර්ශනය කිරීමේ සහ නඩු පැවරීමේ කාර්යය සඳහා, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත යොමු කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ විමර්ශනයක් අවසන් කිරීමෙන් පසුව, ඒකකයේ ප්‍රධානයා විසින්-

(අ) ඒ විමර්ශනයේ නිගමන ඇතුළත් වාර්තාවක් පිළියෙල කරනු ලැබිය යුතු ය; සහ

(ආ) මේ පනත යටතේ වන වරදක් සිදු කරනු ලැබ ඇති බව සැක කිරීමට සාධාරණ හේතු ඒකකයට ඇති බවට ඒකකය නිගමනය කරන අවස්ථාවක, එසේ චෝදනා කරනු ලබන වරද සම්බන්ධයෙන් ඒකකය සතුව ඇති වෙනත් යම් ලේඛන ද සමඟ, ඒ වාර්තාව සලකා බැලීම සඳහා සහ නඩු පැවරීමේ කාර්යය සඳහා නීතිපතිවරයා වෙත යොමු කරනු ලැබිය යුතු ය; හෝ

(ඇ) ඒ විමර්ශනය තුළින්, අල්ලස් පනත යටතේ වූ වරදක් සිදු කිරීම පිළිබඳව හෙළිදරව් වන අවස්ථාවක, ඒ වාර්තාව, විමර්ශනය කිරීමේ සහ නඩු පැවරීමේ කාර්යය සඳහා, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත යොමු කරනු ලැබිය යුතු ය.

ඒකකයේ බලතල.

**24.** මේ පනත යටතේ වන වරදක් සම්බන්ධයෙන් යම් විමර්ශනයක් සිදු කිරීමේ කාර්යය සඳහා මෙහි පහත සඳහන් බලතල ඒකකයට තිබිය යුතු යː-

(අ) ලබා ගැනීමට හෝ භාරගැනීමට අවශ්‍ය යයි හෝ යෝග්‍ය යයි ඒකකය කල්පනා කරන සියලු ලිඛිත හෝ වාචික සාක්ෂි ලබා ගැනීම හා භාරගැනීම සහ ප්‍රශ්න කරනු ලැබීමට අවශ්‍ය යයි හෝ යෝග්‍ය යයි ඒකකය කල්පනා කරන සියලු තැනැත්තන්ගෙන් ප්‍රශ්න කිරීම;

(ආ) ඒකකය විසින් ප්‍රශ්න කරනු ලැබීමේ කාර්ය සඳහා ඒකකය හමුවට පැමිණෙන ලෙස යම් තැනැත්තකුට නියම කිරීම

සහ විමර්ශනය කරනු ලබන කාරණාවලට ඒකකයේ මතය අනුව අදාළ වන ඒකකය විසින් ඒ තැනැත්තාගෙන් අසනු ලබන ප්‍රශ්නවලට දිවුරුම් ප්‍රකාශයක් මගින් පිළිතුරු දෙන ලෙස හෝ අවශ්‍ය නම් (17 වන අධිකාරය වූ) දිවුරුම් හෝ ප්‍රතිඥා ආඥාපනතට අනුකූලව දිවුරුම් හෝ ප්‍රතිඥා දෙන ලෙස හෝ නියම කිරීම;

(ඇ) තම සන්තකයෙහි හෝ පාලනයෙහි තිබෙන යම් දත්ත, තොරතුරක්, ලේඛනයක් හෝ වෙනත් දෙයක් ඉදිරිපත් කිරීම සඳහා යම් තැනැත්තකු කැඳවීම;

(ඈ) යම් සේවා සැපයුම්කරුවකු සන්තකයෙහි හෝ පාලනයෙහි තිබෙන යම් සේවාදායක තොරතුරු හෝ හුවමාරු වන දත්ත ඉදිරිපත් කරන ලෙස ඒ සේවා සැපයුම්කරුට නියම කිරීම;

(ඉ) (i) මේ පනත යටතේ වන වරදක් සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කරනු ලබන්නේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද, ඒ තැනැත්තාගේ;

(ii) ඒ තැනැත්තාගේ කලත්‍රයාගේ හෝ යම් ළමයකුගේ;

(iii) ඒ තැනැත්තා අධ්‍යක්ෂවරයකු වන සමාගමක;

(iv) ඒ තැනැත්තාට අර්ථලාභී සම්බන්ධතාවක් ඇති භාරයක;

(v) ඒ තැනැත්තා හවුල්කරුවකු වන හවුල් ව්‍යාපාරයක,

යම් ගිණුමකට අදාළ සටහන් ඇතුළත් බැංකුවේ යම් පොතක්, ලේඛනයක් හෝ චෙක්පතක්, දැන්වීමෙහි නිශ්චිතව සඳහන් යම් කාලයක් ඇතුළත ඉදිරිපත් කරන ලෙස නැතහොත් ඒ පොතේ, ලේඛනයේ හෝ චෙක්පතේ හෝ එහි යම් සටහනක සහතික කරන ලද පිටපත් දැන්වීමෙහි නිශ්චිතව සඳහන් පරිදි ඉදිරිපත් කරන ලෙස යම් බැංකුවක කළමනාකාරවරයාට ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින් විධාන කිරීම;

(ඊ) තොරතුරුවල රහස්‍යභාවය සම්බන්ධයෙන්, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ අන්තර්ගත විධිවිධානවල කුමක් සඳහන් වුව ද-

(i) මේ පනත යටතේ වන වරදක් සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කරනු ලබන්නේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තාගේ; හෝ

(ii) ඒ තැනැත්තාගේ කලත්‍රයාගේ හෝ යම් ළමයකුගේ,

කටයුතුවලට අදාළව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ඇති සියලු තොරතුරු දැන්වීමෙහි නිශ්චිතව සඳහන් පරිදි ඉදිරිපත් කරන ලෙස සහ එම කොමසාරිස් ජනරාල්වරයාගේ සන්තකයේ හෝ පාලනය යටතේ ඇති ඒ තැනැත්තාට හෝ ඒ තැනැත්තාගේ කලත්‍රයාට හෝ ළමයකුට අදාළ වන්නා වූ යම් ලේඛනයක් හෝ යම් ලේඛනයක සහතික කරන ලද පිටපතක් හෝ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් පරිදි ඉදිරිපත් කරන ලෙස ඒ කොමසාරිස් ජනරාල්වරයාට ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින් විධාන කිරීම;

(ඩ) මේ පනත යටතේ වන වරදක් සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කරනු ලබන්නේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද, ඒ තැනැත්තාට-

(i) කවර හෝ අවස්ථාවක හෝ ඒකකය විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන යම් අවස්ථාවක, ඒ තැනැත්තාගේ හෝ ඒ තැනැත්තාගේ කලත්‍රයාගේ හෝ ළමයකුගේ අයිතියේ තිබූ හෝ සන්තකයේ තිබූ සියලු චංචල හෝ නිශ්චල දේපළ සඳහන් කර දක්වන්නා වූ ද, එසේ සඳහන් කර ඇති එක් එක් දේපළ මිලදී ගැනීමෙන්, තෑගි ලැබීමෙන්, අන්තිම කැමැත්තක් මගින් ප්‍රදානයකින්, උරුමවීමෙන් හෝ අන්‍යාකාරයකින් හෝ වුව ද අත්කර ගනු ලැබූ දිනය නිශ්චිතව සඳහන් කරන්නා වූ ද; සහ

(ii) ඒකකයේ මතය අනුව විමර්ශනයට අදාළ වෙනත් කාරණා පිළිබඳ විස්තර ඇතුළත් වූ ද,

දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කරන ලෙස විධාන කිරීම;

(ඪ) (i) කවර හෝ අවස්ථාවක හෝ ඒකකය විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන යම් අවස්ථාවක, යම්

තැනැත්තකුගේ අයිතියේ තිබූ හෝ සන්තකයේ තිබූ සියලු චංචල හෝ නිශ්චල දේපළ පිළිබඳ යම් තොරතුරු ඒකකය විසින් සිදු කරනු ලබන විමර්ශනයකට උපකාරයක් විය හැකි බව විශ්වාස කිරීමට ඒකකයට යුක්ති සහගත හේතු පවත්නා අවස්ථාවක, ඒ චංචල හෝ නිශ්චල දේපළ පිළිබඳ තොරතුරු සඳහන් කර දක්වන්නා වූ ද; සහ

(ii) ඒකකයේ මතය අනුව ඒකකය විසින් සිදු කරනු ලබන විමර්ශනයකට අදාළ වෙනත් කාරණා පිළිබඳ විස්තර ඇතුළත් වූ ද,

දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කරන ලෙස යම් තැනැත්තකුට විධාන කිරීම;

(එ) ඒකකය විසින් තත්කාර්යය සඳහා ඉදිරිපත් කරන ඉල්ලුම් පත්‍රයක් මත, මහෙස්ත්‍රාත්වරයකු විසින් නිකුත් කරනු ලබන ආඥාවක බලය යටතේ-

(i) මේ පනත යටතේ වන වරදක් සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කරනු ලබන්නේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තා;

(ii) ඒ තැනැත්තාගේ කලත්‍රයා හෝ යම් ළමයකු;

(iii) ඒ තැනැත්තා වෙනුවෙන් භාරයක් වශයෙන් යම් දේපළක් දරන වෙනත් යම් තැනැත්තකු;

(iv) ඒ තැනැත්තා අධ්‍යක්ෂවරයකු වන සමාගමක්; හෝ

(v) ඒ තැනැත්තා හවුල්කරුවකු වන හවුල් ව්‍යාපාරයක්,

විසින් ඒ ආඥාවේ නිශ්චිතව සඳහන් යම් චංචල හෝ නිශ්චල දේපළක අයිතිය හෝ ඒ යම් දේපළකට ඇති යම් සම්බන්ධතාවක් ඒ ආඥාව ඒ අධිකරණය විසින් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලබන තෙක් පැවරීම තහනම් කිරීම;

(ඒ) ඒකකය විසින් තත්කාර්යය සඳහා ඉදිරිපත් කරන ඉල්ලුම් පත්‍රයක් මත, මහෙස්ත්‍රාත්වරයකු විසින් නිකුත් කරනු ලබන ආඥාවක බලය යටතේ-

(i) මේ පනත යටතේ වන වරදක් සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කරනු ලබන්නේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තාගේ විදේශ ගමන් බලපත්‍රය සහ වෙනත් ගමන් ලේඛන, ඒ ආඥාවෙහි නිශ්චිතව සඳහන් කරනු ලබන මාස තුනක් නො ඉක්මවන කාලයක් සඳහා පරිරෝධ කරන ලෙස ආගමන හා විගමන පාලකවරයාට නියම කිරීම;

(ii) මේ පනත යටතේ වන වරදක් සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කරනු ලබන්නේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තා ඒ ආඥාවෙහි නිශ්චිතව සඳහන් කරනු ලබන මාස තුනක් නො ඉක්මවන කාලයක් සඳහා ශ්‍රී ලංකාවෙන් බැහැර යාම වැළැක්වීම පිණිස අවශ්‍ය සියලු පියවර ගන්නා ලෙස ඒ ආඥාවෙහි නමින් හෝ නිලයෙන් නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු යම් පොලිස් නිලධරයකුට නියම කිරීම; සහ

(ඔ) යම් තැනැත්තකුගෙන්, යම් රාජ්‍ය හෝ රාජ්‍ය නොවන ආයතනයකින් හෝ යම් විදේශීය නියෝජිතායතනයකින් යම් දත්ත, තොරතුරක්, ලේඛනයක් හෝ සාක්ෂියක් කැඳවීම හෝ භාරගැනීම.

අපරාධ නඩු පැවරීම.

**25.** අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ හෝ වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, ඒකකය විසින් 23 වන වගන්තිය යටතේ සිදු කරන ලද විමර්ශනයක දී රැස් කරන ලද කරුණු පදනම් කොට ගෙන නීතිපතිවරයා විසින් මේ පනතේ II වන කොටසේ I වන පරිච්ඡේදය සහ II වන පරිච්ඡේදය යටතේ වන වරදක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහාධිකරණයේ අපරාධ නඩු කටයුතු පවරනු ලැබිය හැකි ය.

පරිශ්‍රවලට ඇතුළු වීමට සහ පරිශ්‍ර හෝ තැනැත්තන් සෝදිසි කිරීමට ඒකකයට බලය ඇති බව.

**26.** (1) ඒකකයට-

(අ) මේ පනත යටතේ වන වරදක් යම් පරිශ්‍රයක සිදු කරනු ලබන බව හෝ මේ පනත යටතේ වන වරදක් යම් පරිශ්‍රයක සිදු කර ඇති බව සහ ඒ වරද සිදු කිරීම පිළිබඳ සාක්ෂි යම් පරිශ්‍රයක හෝ යම් තැනැත්තකු වෙත තිබෙන බව; හෝ

(ආ) මේ පනත යටතේ වන වරදක් සිදු කිරීම හා සම්බන්ධ යම් දත්ත, තොරතුරක්, ලේඛනයක් හෝ මෙවලමක් යම් පරිශ්‍රයක හෝ යම් තැනැත්තකු වෙත තිබෙන බව,

සැක කිරීමට යුක්ති සහගත හේතු පවතින අවස්ථාවක, ඒකකයේ යම් සාමාජිකයකු විසින් හෝ ඒකකයේ ප්‍රධානයා විසින් බලය පවරන ලද යම් තැනැත්තකු විසින් අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ විධිවිධානවලට අනුකූලව ඒ පරිශ්‍රයට ඇතුළු වීම සහ ඒ පරිශ්‍රය හෝ ඒ පරිශ්‍රයෙහි සිටින යම් තැනැත්තකු සෝදිසි කිරීම කළ හැකි ය. ඒ සෝදිසි කිරීම සිදු කිරීම සඳහා ඒ සාමාජිකයා හෝ තැනැත්තා විසින් ඒකකයෙන් පරිබාහිර පොලිස් නිලධරයන්ගේ සහාය ලබාගත හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් පරිශ්‍රයකට ඇතුළු වන සහ යම් පරිශ්‍රයක් හෝ තැනැත්තකු සෝදිසි කරන ඒකකයේ සාමාජිකයකු හෝ ඒකකයේ ප්‍රධානයා විසින් බලය පවරන ලද යම් තැනැත්තකු විසින්, අපරාධ නඩු විධාන සංග්‍රහය පනත මගින් විධිවිධාන සලස්වා ඇති ආකාරයට-

(අ) ඒ පරිශ්‍රයෙහි හෝ තැනැත්තා වෙත හෝ තිබී සොයා ගනු ලබන්නා වූ ද, මේ පනත යටතේ වන වරදක් සිදු කිරීම පිළිබඳ සාක්ෂියක් බව විශ්වාස කිරීමට ඒ සාමාජිකයාට හෝ බලය පවරන ලද තැනැත්තාට යුක්ති සහගත හේතු ඇත්තා වූ ද යම් මෙවලමක් තහනමට ගනු ලැබිය හැකි ය;

(ආ) ඒ පරිශ්‍රයෙහි හෝ තැනැත්තා වෙත හෝ තිබී සොයා ගනු ලබන්නා වූ ද, මේ පනත යටතේ වන වරදක් සිදු කිරීම පිළිබඳ සාක්ෂියක් බව විශ්වාස කිරීමට ඒ සාමාජිකයාට හෝ බලය පවරන ලද තැනැත්තාට යුක්ති සහගත හේතු ඇත්තා වූ ද යම් දත්ත, තොරතුරක් හෝ ලේඛනයක් තහනමට ගැනීම හෝ එහි යම් පිටපතක් ලබා ගැනීම හෝ කළ හැකි ය; හෝ

(ඇ) ඒ පරිශ්‍රයෙහි සිටින්නා වූ ද, මේ පනත යටතේ වන වරදක් සිදු කිරීම හා සම්බන්ධ බව විශ්වාස කිරීමට ඒ සාමාජිකයාට හෝ බලය පවරන ලද තැනැත්තාට යුක්ති සහගත හේතු ඇත්තා වූ ද යම් තැනැත්තකු අත්අඩංගුවට ගැනීම කළ හැකි ය.

(3) මේ පනත යටතේ වන වරදක් සිදු කරන ලදැයි සැක කරනු ලබන යම් තැනැත්තකු වරෙන්තුවක් නොමැතිව අත්අඩංගුවට ගන්නා වූ ඒකකයේ සාමාජිකයකු හෝ ඒකකයේ ප්‍රධානයා විසින් බලය පවරන ලද යම් තැනැත්තකු විසින්, අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව සහ ඒ අත්අඩංගුවට ගැනීම සිදු කළ ස්ථානයේ සිට මහෙස්ත්‍රාත්වරයා වෙත යාමට ගත වන කාලය අතහැර, ඒ තැනැත්තා අත්අඩංගුවට ගත් වේලාවේ සිට පැය විසිහතරක කාලයක් ඇතුළත ඒ තැනැත්තා අත්අඩංගුවට ගත් ස්ථානයට ආසන්නතම මහෙස්ත්‍රාත් අධිකරණයේ මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(4) මේ වගන්තිය ප්‍රකාරව යම් පරිශ්‍රයකට ඇතුළු වීමට යම් තැනැත්තකුට යම් බලයක් තිබෙන අවස්ථාවක, ඒ බලය ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා යුක්ති සහගතව අවශ්‍ය විය හැකි යම් බලයක් ඒ තැනැත්තා විසින් යොදනු ලැබිය හැකි ය.

(5) ස්ත්‍රියක සෝදිසි කිරීමට සැලැස්වීම අවශ්‍ය වන කවර අවස්ථාවක දී වුව ද, ඒ සෝදිසි කිරීම, විනීතතාව කෙරෙහි ඉතාමත් සැලකිලිමත්ව වෙනත් ස්ත්‍රියක විසින් කළ යුතු ය.

තොරතුරු සුරක්ෂිත කිරීම.

**27.** (1) (අ) මේ පනත යටතේ වූ යම් විමර්ශනයක කාර්ය සඳහා යම් ඉලෙක්ට්‍රොනික මෙවලමක් තුළ ගබඩා කර ඇති යම් තොරතුරු හෝ දත්ත යුක්ති සහගතව අවශ්‍ය බවට; සහ

(ආ) ඒ තොරතුරු හෝ දත්ත නැති විය හැකි බවට, විනාශ විය හැකි බවට, වෙනස් කළ හැකි බවට හෝ ඒ තොරතුරු හෝ දත්ත වෙතට ප්‍රවේශය අහිමි විය හැකි බවට අවදානමක් පවතින බවට,

ඒකකයේ සාමාජිකයකු හෝ ඒකකයේ ප්‍රධානයා විසින් බලය පවරන ලද යම් තැනැත්තකු සෑහීමට පත්වන අවස්ථාවක දී ඒ සාමාජිකයා හෝ බලය පවරන ලද තැනැත්තා විසින්, ඒ ඉලෙක්ට්‍රොනික මෙවලම පාලනය කරනු ලබන තැනැත්තාට ලිඛිත දැන්වීමක් නිකුත් කිරීම මගින් ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කෙරෙන දින තිහක් නො ඉක්මවන කාලයක් සඳහා ඒ තොරතුරු හෝ දත්ත සුරක්ෂිත කළ යුතු බවට නියම කරනු ලැබිය හැකි ය.

(2) නිසි අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයකු වෙත කරන ලද ඉල්ලීමක් මත, තොරතුරු හෝ දත්ත සුරක්ෂිත කරනු ලැබිය

යුතු කාලසීමාව තවදුරටත් දීර්ඝ කරනු ලැබිය හැකි අතර, ඒ මුළු කාලසීමාව දින අනූවක් නො ඉක්ම විය යුතු ය.

යම් මෙවලමක් තහනමට ගැනීම මගින් එහි සාමාන්‍ය භාවිතය අවහිර නොවිය යුතු බව.

**28.** මේ පනත යටතේ වන වරදක් සම්බන්ධයෙන් වූ යම් විමර්ශනයක දී යම් සෝදිසි කිරීමක්, පරීක්ෂා කිරීමක් හෝ යම් දෙයක් සිදු කරන ඒකකයේ සාමාජිකයකු හෝ ඒකකයේ ප්‍රධානයා විසින් බලය පවරන ලද යම් තැනැත්තකු හෝ විසින්-

(අ) සෝදිසි කරනු ලබන හෝ පරීක්ෂා කරනු ලබන යම් මෙවලමක් භාවිත කරනු ලැබිය හැකි සාමාන්‍ය නීත්‍යානුකූල එදිනෙදා කටයුතුවලට ඒ සෝදිසි කිරීම, පරීක්ෂා කිරීම හෝ විමර්ශනය කිරීම මගින් අවහිර නොවීම සහතික කිරීම සඳහා සෑම උත්සාහයක් ම ගනු ලැබිය යුතු ය; සහ

(ආ) (i) ඒ මෙවලම තබා ඇති පරිශ්‍රයේ දී ඒ සෝදිසි කිරීම හෝ පරීක්ෂා කිරීම සිදු කළ නොහැකි නම් මිස; හෝ

(ii) ඒ වරද සිදු කිරීම වැළැක්වීමට හෝ ඒ වරද තවදුරටත් කරගෙන යාම වැළැක්වීමට හෝ තම භාරයට නොගතහොත් නැති විය හැකි, විනාශ විය හැකි, වෙනස් කළ හැකි හෝ ප්‍රවේශය අහිමි විය හැකි යම් තොරතුරු හෝ දත්ත තම භාරයට ගැනීම සඳහා ඒ මෙවලම තහනමට ගැනීම අත්‍යවශ්‍ය වන්නේ නම් මිස,

තහනමට ගැනීම මගින් ඒ මෙවලම භාවිත කරනු ලබන ඒ සාමාන්‍ය නීත්‍යානුකූල කටයුතුවලට අගතියක් සිදු වේ නම් ඒ මෙවලම තහනමට ගැනීම නො කළ යුතු ය.

තහනමට ගනු ලැබූ ලේඛන ආදිය පිළිබඳ ලැයිස්තුවක් නිකුත් කිරීම.

**29.** මේ පනත යටතේ වූ වරදක් සම්බන්ධයෙන් සිදු කරනු ලබන විමර්ශනයක දී වූ යම් සෝදිසි කිරීමක් හෝ පරීක්ෂා කිරීමක් අතරවාරයෙහි යම් දත්ත, තොරතුරු, ලේඛන හෝ මෙවලම් තහනමට ගනු ලැබ ඇති හෝ ඒ කෙරෙහි ඇති ප්‍රවේශය අහිමි කරනු ලැබ ඇති අවස්ථාවක දී, ඒ සෝදිසි කිරීම හෝ පරීක්ෂා කිරීම සිදු කරන ඒකකයේ සාමාජිකයා හෝ ඒකකය විසින් බලය පවරන ලද තැනැත්තා විසින් ඒ තහනමට ගනු ලැබූ හෝ ප්‍රවේශය අහිමි කරනු ලැබූ දිනය සහ වේලාව ද ඇතුළත්ව, ඒ දත්තවල, තොරතුරුවල, ලේඛනවල හෝ මෙවලම්වල සම්පූර්ණ ලැයිස්තුවක් ඒ දත්තවල, තොරතුරුවල, ලේඛනවල හෝ මෙවලම්වල අයිතිකරුට හෝ භාරකරුට නිකුත් කළ යුතු ය.

II වන කොටසේ I වන පරිච්ඡේදය යටතේ වන වැරදි මහාධිකරණය විසින් විභාග කළ යුතු බව.

**30.** (1) මේ පනතේ II වන කොටසේ I වන පරිච්ඡේදය යටතේ වූ සෑම වරදක්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග වන ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මහාධිකරණය විසින් විභාග කරනු ලැබිය යුතු ය.

(2) මේ පනතේ II වන කොටසේ I වන පරිච්ඡේදය යටතේ වන වරදක් ශ්‍රී ලංකාවෙන් පිටත සිදු කරනු ලැබ ඇති අවස්ථාවක දී-

(අ) ඒ වරද සිදු කළ තැනැත්තා ශ්‍රී ලංකාවේ සිටී නම්;

(ආ) ඒ වරද සිදු කළ තැනැත්තා ශ්‍රී ලංකාවේ පුරවැසියකු වේ නම්;

(ඇ) ඒ වරද සිදු කරන ලදැයි චෝදනා කෙරෙන්නේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තා ශ්‍රී ලංකාවේ පුරවැසියකු වේ නම්; හෝ

(ඈ) ඒ වරද ශ්‍රී ලංකාවේ ගුවන් කලාපය තුළ හෝ ශ්‍රී ලංකා ජල තීරය මත ගුවන්යානයක හෝ නැවක සිදු කරනු ලැබ ඇත්නම්,

ඒ වරද ශ්‍රී ලංකාව තුළ සිදු කරනු ලැබ ඇත්තාක් සේ ඒ වරද විභාග කිරීමට ඒ මහාධිකරණයට අධිකරණ බලය තිබිය යුතු ය.

(3) මේ පනත යටතේ වන යම් වරදක් සම්බන්ධයෙන් වූ යම් නඩු කටයුත්තක දී, මේ පනත මගින් හෝ මේ පනත යටතේ හෝ වෙනත් යම් පනතක් මගින් හෝ වෙනත් යම් පනතක් යටතේ හෝ කිසිදු විධිවිධානයක් පනවා නොමැති හෝ ප්‍රමාණවත් විධිවිධාන පනවා නොමැති යම් බලයක් ක්‍රියාත්මක කිරීම පිළිබඳ ප්‍රශ්නයක් ද ඇතුළුව කවර හෝ ප්‍රශ්නයක් පැන නඟින අවස්ථාවක, මේ පනතේ යම් විධිවිධානයක් සමඟ පරස්පර නොවන තාක් දුරට හෝ අනනුකූල නොවන තාක් දුරට වූ යම් ආඥා හෝ විධාන කිසිවක් කිරීමට මහාධිකරණයට බලය ඇත්තේ ය.

V වන කොටස

**සාමාන්‍ය විධිවිධාන**

රහස්‍යභාවය ආරක්ෂා කිරීමේ යුතුකම.

**31.** ලේකම්වරයා, ක්‍රීඩා අධ්‍යක්ෂවරයා, ඒකකයේ සෑම සාමාජිකයකු ම හෝ මේ පනත යටතේ ලේකම්වරයාට හෝ ක්‍රීඩා අධ්‍යක්ෂවරයාට හෝ ඒකකයට සහාය වීම සඳහා පත් කරන ලද

සෑම නිලධරයකු ම, සේවානියුක්තයකු ම හෝ වෙනත් තැනැත්තකු ම ඒ ලේකම්වරයාගේ, ක්‍රීඩා අධ්‍යක්ෂවරයාගේ, සාමාජිකයාගේ, නිලධරයාගේ, සේවානියුක්තයාගේ හෝ තැනැත්තාගේ කාර්ය ආරම්භ කිරීමට පෙරාතුව, මේ පනත යටතේ ස්වකීය බලතල සහ කාර්ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටුකිරීමේ දී තමා වෙත හෝ තමාගේ සන්තකයට ලැබෙන හෝ තමාට දැන ගැනීමට ලැබෙන කවර හෝ තොරතුරක්-

(අ) මේ පනතේ විධිවිධාන බලාත්මක කිරීමේ කාර්යය සඳහා;

(ආ) වෙනත් යම් ලිඛිත නීතියක යම් විධිවිධානයක් යටතේ නියම කරනු ලැබූ විට; හෝ

(ඇ) අධිකරණයක් මගින් නියම කරනු ලැබූ විට,

හෝ හැර හෙළිදරව් නොකරන බවට පොරොන්දු වෙමින් ප්‍රකාශයකට අත්සන් තැබිය යුතු ය.

**32.** (1) මේ පනත යටතේ යම් තොරතුරු හෝ දත්ත සපයන ලෙස ඉල්ලීමක් කොට ඇත්තේ හෝ යම් තොරතුරු හෝ දත්ත ලබා ගෙන ඇත්තේ යම් සේවා සැපයුම්කරුවකුගෙන් ද, නැතහොත් 27 වන වගන්තිය යටතේ යම් තොරතුරු හෝ දත්ත සුරක්ෂිත කිරීම සඳහා ලිඛිත දැන්වීමක් නිකුත් කරනු ලැබ ඇත්තේ යම් තැනැත්තකු වෙත ද ඒ සේවා සැපයුම්කරු හෝ තැනැත්තා විසින් ඒ තොරතුරු හෝ දත්ත සම්බන්ධයෙන් සහ ඒ තොරතුරු හෝ දත්ත ඉල්ලා සිටීම, ලබාගෙන තිබීම හෝ සුරක්ෂිත කිරීමට නියම කිරීම යන කාරණයකට අදාළව අතිශය රහස්‍යභාවයක් පවත්වාගෙන යා යුතු අතර, නීත්‍යනුකූල අධිකාරී බලයක් ඇතිව මිස ඒ කරුණු පිළිබඳව කිසිදු හෙළිදරව්වක් නො කළ යුතු ය.

සේවා සැපයුම්කරුවන් විසින් රහස්‍යභාවය ආරක්ෂා කළ යුතු බව.

(2) මේ පනත යටතේ වූ යම් විමර්ශනයක කාර්ය සඳහා යම් තොරතුරු හෝ දත්ත හෙළිදරව් කිරීම සම්බන්ධයෙන් යම් සේවා සැපයුම්කරුවකු සිවිල් හෝ අපරාධ නීතිය යටතේ වගකීමට යටත් නො විය යුතු ය.

**33.** (1) මේ පනත යටතේ පිළිගත් සෑම ජාතික ක්‍රීඩා සංගමයක ම කළමනාකරණ මණ්ඩලයේ ලේකම්වරයා විසින්, ලේකම්වරයාගේ මාර්ගෝපදේශවලට යටත්ව, ඒ ක්‍රීඩාවේ විනය පවත්වාගෙන යාම සහතික කිරීමේ කාර්යය සහ ක්‍රීඩාවල තරග පාවාදීම, දූෂණය, නීති විරෝධී මෙහෙයවීම සහ නීති විරෝධී ඔට්ටු ඇල්ලීම වැළැක්වීමේ

ආචාරධර්ම පද්ධතියක් පවත්වාගෙන යාම.

කාර්යය සඳහා, ඒ ක්‍රීඩාවට සම්බන්ධ තැනැත්තන්ගේ චර්යාව පාලනය කෙරෙන ආචාරධර්ම පද්ධතියක් පවත්වාගෙන යා යුතු ය.

(2) ක්‍රීඩාවකට සම්බන්ධ සෑම තැනැත්තකු ම, අදාළ ක්‍රීඩාවේ ආචාරධර්ම පද්ධතියේ විධිවිධානවලට යටත් විය යුතු ය.

(3) යම් ක්‍රීඩාවක ආචාරධර්ම පද්ධතියේ විධිවිධාන උල්ලංඝනය කරමින් ක්‍රියා කරන යම් ක්‍රීඩාවකට සම්බන්ධ තැනැත්තකු, ඒ ආචාරධර්ම පද්ධතියේ විධිවිධාන සලසා ඇති දණ්ඩනවලට ද යටත් විය යුතු ය.

ත්‍යාග අරමුදල.

**34.** (1) මේ පනත යටතේ යම් තැනැත්තකු විසින් සිදු කරන ලද යම් වරදක් අනාවරණය කර ගැනීමට ද ඒ සම්බන්ධයෙන් නඩු පැවරීමට ද ඉවහල් වන තොරතුරු සපයන තැනැත්තන්ට ත්‍යාග පිරිනැමීමේ කාර්යය සඳහා ලේකම්වරයාගේ පාලනය සහ පරිපාලනය යටතේ ත්‍යාග අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය. ඒකකයේ සාමාජිකයන් ත්‍යාග අරමුදලෙන් යම් ත්‍යාගයක් සඳහා හිමිකම් නො ලැබිය යුතු ය.

(2) තත්කාර්යය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල වෙන් කරනු ලැබිය හැකි මුදල් ප්‍රමාණ ත්‍යාග අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින්, තොරතුරු සපයන තැනැත්තන්ට ත්‍යාග මුදල් ගෙවනු ලැබිය යුතු ආකාරය නියම කරනු ලැබිය හැකි ය. ත්‍යාග මුදලක ප්‍රමාණය, වරදක් අනාවරණය කර ගැනීම, ඒ සම්බන්ධයෙන් නඩු පැවරීම සහ සාර්ථකව නඩුව පවත්වාගෙන යාම මත පදනම්ව තීරණය කරනු ලැබිය යුතු ය.

(4) ලේකම්වරයා විසින්, ත්‍යාග අරමුදලේ ආදායම සහ වියදම සහ ත්‍යාග අරමුදල සම්බන්ධයෙන් වූ අනෙකුත් සියලු මූල්‍ය ගනුදෙනු පිළිබඳ විධිමත් ගිණුම් පොත් පවත්වාගෙන යාමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(5) ත්‍යාග අරමුදලේ ගිණුම් විගණනයට සහ ත්‍යාග අරමුදලේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන අදාළ විය යුතු ය.

**35.** ඒකකයේ යම් සාමාජිකයකු හෝ මේ පනතේ කාර්ය සඳහා ඒකකයට සහාය වීමට පත් කරන ලද යම් නිලධරයකු, සේවානියුක්තයකු හෝ වෙනත් යම් තැනැත්තකු විසින් මේ පනත මගින් හෝ මේ පනත යටතේ පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව හෝ මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා, අවස්ථාවෝචිත පරිදි, ඒ සාමාජිකයා හෝ ඒ නිලධරයා, සේවානියුක්තයා හෝ තැනැත්තා විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි සැලකෙන යම් නීත්‍යානුකූල ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් නඩුවක දී හෝ වෙනත් නීති කෘත්‍යයක දී වගකීමට යටත් නො විය යුතු ය.

සද්භාවයෙන් කරන ලද ක්‍රියා සම්බන්ධයෙන් ආරක්ෂාව.

**36.** ශ්‍රී ලංකා ආණ්ඩුව සහ වෙනත් යම් රාජ්‍යයක ආණ්ඩුව අතර උදර්පණ වැඩපිළිවෙළක් බලාත්මකව ඇති අවස්ථාවක දී, ඒ වැඩපිළිවෙළට, ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පණ පනතේ කාර්යය සඳහා මේ පනතේ II වන කොටසේ I වන පරිච්ඡේදය යටතේ වූ වරදක් සම්බන්ධයෙන් උදර්පණය කිරීම සඳහා වූ විධිවිධාන ඇතුළත් වන ලෙස සලකනු ලැබිය යුතු ය.

උදර්පණ වැඩපිළිවෙළට අදාළ විධිවිධාන.

**37.** ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පණ පනතේ උපලේඛනයේ “ආ” කොටසට පෙරාතුව ම පහත සඳහන් කොටස ඇතුළත් කිරීමෙන් ඒ පනත මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

“( ) 2019 අංක 24 දරන ක්‍රීඩාවලට සම්බන්ධ වැරදි වැළැක්වීමේ පනතේ අර්ථානුකූලව වූ වරදක්.”.

ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පණ පනත සංශෝධනය කිරීම.

**38.** ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පණ පනතේ කුමක් සඳහන් වුව ද, මේ පනතේ II වන කොටසේ I වන පරිච්ඡේදය යටතේ වන වරදක්, ඒ පනත යටතේ උදර්පණය කිරීමේ කාර්ය සඳහා පමණක්, රාජ්‍ය මූල්‍යමය වරදක් හෝ දේශපාලන ස්වභාවයේ වරදක් හෝ දේශපාලන වරදකට සම්බන්ධ වරදක් හෝ දේශපාලන හේතුවලින් පෙලඹ වූ වරදක් වශයෙන් සලකනු නො ලැබිය යුතු ය.

උදර්පණ පනත සම්බන්ධයෙන් අර්ථ නිරූපනය.

**39.** (1) නියම කරනු ලැබිය යුතු යයි මේ පනතින් නියමිත හෝ මේ පනත යටතේ නියෝග සෑදීමට නියමිත හෝ නියෝග සෑදීමට බලය දී ඇති සියලු කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් මේ පනත යටතේ නියෝග සාදනු ලැබිය හැකි ය.

නියෝග.

(2) විශේෂයෙන් ම සහ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, අමාත්‍යවරයා විසින් මේ පනත යටතේ වූ වැරදි වැළැක්වීමේ, අනාවරණය කර ගැනීමේ හෝ විමර්ශනය කිරීමේ කාර්යය සඳහා ගනු ලැබිය යුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලැබූ දිනයේ සිට හෝ නියෝගයේ නිශ්චිතව සඳහන් යම් පසු දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(4) (අ) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු මාස තුනක් ඇතුළත, අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(ආ) එසේ අනුමත කරනු නො ලැබූ යම් නියෝගයක් ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතු නමුත්, ඒ නියෝගය යටතේ ඊට පූර්වයෙන් කරන ලද කිසිවකට ඉන් අගතියක් නො විය යුතු ය.

(5) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ යම් නියෝගයක් එසේ පරිච්ඡින්න වූ ලෙස සැලකෙන දිනය පිළිබඳ නිවේදනයක් *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපනය.

**40.** මේ පනතේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස-

''ඔට්ටු මෙහෙයුම්කරු'' යන්නෙන්, යම් ක්‍රීඩාවක් හෝ ක්‍රීඩා ඉසව්වක් සම්බන්ධයෙන් කවර හෝ ස්වරූපයක ඔට්ටු ඇල්ලීමේ ක්‍රියාකාරකමක් ප්‍රවර්ධනය කරන, තැරැව් කරන, සකස් කරන හෝ සිදු කරන යම් සමාගමක් හෝ ව්‍යාපාරයක් අදහස් වන අතර, ඊට ඒ සමාගමේ හෝ ව්‍යාපාරයේ යම් අධ්‍යක්ෂවරයකු, හවුල්කරුවකු, නිලධරයකු, සේවානියුක්තයකු, සේවකයකු හා අනුයෝජිතයකු ද ඇතුළත් වේ;

''කළමනාකරණ මණ්ඩලය'' යන්නෙන්, යම් ජාතික ක්‍රීඩා සංගමයක කටයුතුවල කළමනාකරණය සහ පරිපාලනය භාරව සිටින මණ්ඩලය අදහස් වේ;

"ළමයා" යන්නෙන්, වයස අවුරුදු දහඅටට අඩු පිරිමි හෝ ගැහැනු අයකු අදහස් වේ;

"අපරාධ නඩු විධාන සංග්‍රහය පනත" යන්නෙන්, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත අදහස් වේ;

"දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා" යන්නෙන්, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 97 වන වගන්තිය යටතේ පත් කරනු ලබන දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා අදහස් වේ;

"අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව" යන්නෙන්, 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 2 වන වගන්තිය මගින් පිහිටුවන ලද අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව අදහස් වේ;

"පරිගණක පද්ධතිය" යන්නෙන්, අන්තර්ජාලය ද ඇතුළත්ව, පරිගණකයක් හෝ එකිනෙකට සම්බන්ධ පරිගණක සමූහයක් අදහස් වේ;

"ආගමන හා විගමන පාලකවරයා" යන්නෙන්, (351 වන අධිකාරය වූ) ආගාමික හා විගාමික පනතේ 4 වන වගන්තිය යටතේ පත් කරන ලද ආගමන හා විගමන පාලකවරයා අදහස් වේ;

"ක්‍රීඩා අධ්‍යක්ෂවරයා" යන්නෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 3 වන වගන්තිය යටතේ පත් කරන ලද ක්‍රීඩා අධ්‍යක්ෂවරයා අදහස් වේ;

"මෙවලම" යන්නට, ඉලෙක්ට්‍රොනික මෙවලමක් ද ඇතුළත් වේ;

"ලේඛනය" යන්නට, යම් ඉලෙක්ට්‍රොනික ලේඛනයක් ද ඇතුළත් වේ;

''ඉලෙක්ට්‍රොනික මෙවලම'' යන්නෙන්, සන්නිවේදනය සඳහා හෝ තොරතුරු හෝ දත්ත සැකසීම හෝ සම්ප්‍රේෂණය කිරීම සඳහා භාවිත කරනු ලබන යම් මෙවලමක් අදහස් වේ;

''ඉලෙක්ට්‍රොනික ක්‍රමය'' යන්නට, ඊ-මේල්, ෆැක්ස්, කෙටි පණිවිඩ සේවය (එස්.එම්.එස්), ස්ථාවර දුරකථනය, ජංගම දුරකථනය සහ යම් මාර්ගගත ක්‍රමයක් ඇතුළත් වේ;

''ඉලෙක්ට්‍රොනික ලේඛනය'' යන්නෙන්, ඉලෙක්ට්‍රොනික ක්‍රමයකින් හෝ ක්ෂුද්‍ර පටල (මයික්‍රෝ ෆිල්ම්) හෝ ඒ හා සමාන ආකාරයේ ක්‍රමයකින් උත්පාදනය කරන ලද, ආචය කරන ලද, ලබාගත් හෝ යවන ලද තොරතුරු, වාර්තා හෝ දත්ත අදහස් වේ;

''තොරතුරු'' යන්නට, දත්ත, පාඨ, අනුරූප, ශබ්ද, කේත, දත්ත සමුදාය හෝ ක්ෂුද්‍ර පටල ඇතුළත් වේ;

''අමාත්‍යවරයා'' යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43 වන හෝ 44 වන ව්‍යවස්ථාව යටතේ ක්‍රීඩා විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා අදහස් වේ;

''ජාතික ක්‍රීඩා සංගමය'' යන්නෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනත ප්‍රකාරව පිහිටුවන ලද යම් ජාතික ක්‍රීඩා සංගමයක් අදහස් වේ;

''ක්‍රීඩාවකට සම්බන්ධ තැනැත්තකු'' යන්නෙන් -

(අ) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 18 වන වගන්තිය මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවේ යම් සාමාජිකයකු හෝ සේවානියුක්තයකු;

(ආ) යම් ජාතික ක්‍රීඩා සංගමයක සාමාජිකයකු හෝ සේවානියුක්තයකු වන යම් තැනැත්තකු;

(ඇ) යම් ජාතික ක්‍රීඩා සංගමයක අනුබද්ධ සාමාජිකයකු, ක්‍රීඩා සමාජයක්, කණ්ඩායමක්,

සංගමයක් හෝ ලීගයක් වන යම් තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක්;

(ඇ) යම් ජාතික ක්‍රීඩා සංගමයක් විසින් ජාතිකව හෝ ජාත්‍යන්තරව සංවිධානය කරන ලද, පවත්වන ලද, කැඳවන ලද හෝ බලය දෙන ලද, යම් ක්‍රීඩාවකට, ක්‍රීඩා ඉසව්වකට, ජාත්‍යන්තර තරගයකට, තරගාවලියකට හෝ ශූරතාවකට සහභාගී වන යම් ක්‍රීඩකයකු;

(ඉ) යම් ජාතික ක්‍රීඩා සංගමයක සාමාජිකයකු වන බාල වයස්කාර ක්‍රීඩකයකු සම්බන්ධයෙන් වන විට, ඒ ක්‍රීඩකයාගේ දෙමාපියන්, භාරකරුවන් හෝ අනුයෝජිතයන්; සහ

(ඊ) යම් ක්‍රීඩාවක් හෝ ක්‍රීඩා ඉසව්වක් හා සම්බන්ධ නිලධරයකු, තේරීම්කරුවකු, ක්‍රීඩා කළමනාකරුවකු, කමිටු සාමාජිකයකු, ක්‍රීඩා පුහුණුකරුවකු, පුහුණු කරන්නකු, සම්බාහකයකු, භෞත චිකිත්සකයකු, වෛද්‍ය නිලධරයකු, පරිපූරක වෛද්‍ය සේවකයකු, විනිසුරුවරයකු, තරග විනිශ්චයකරුවකු, තරග තීරකවරයකු, ක්‍රීඩාංගණ භාරකරුවකු, සහාය කාර්ය මණ්ඩල සාමාජිකයකු, ක්‍රීඩාංගණ කාර්ය මණ්ඩල සාමාජිකයකු හෝ ක්‍රීඩාපිටි කාර්ය මණ්ඩල සාමාජිකයකු, ක්‍රීඩා හවුල්කරුවකු සහ අනුග්‍රාහකයකු වන යම් තැනැත්තකු,

අදහස් වේ;

''ක්‍රීඩකයා'' යන්නෙන්, පාසල්, ක්‍රීඩා සමාජ, පළාත්, ජාතික හෝ ජාත්‍යන්තර මට්ටමේ යම් ක්‍රීඩාවකට හෝ ක්‍රීඩා ඉසව්වකට සහභාගී වන යම් තැනැත්තකු අදහස් වේ;

''පරිශ්‍රය'' යන්නට, යම් වාහනයක්, යාත්‍රාවක් හෝ ගුවන්යානයක් ඇතුළත් වේ;

"නියම කරන ලද" යන්නෙන්, මේ පනත යටතේ සාදන ලද නියෝග මගින් නියම කරනු ලැබූ යන්න අදහස් වේ;

"ලේකම්වරයා" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43 වන හෝ 44 වන ව්‍යවස්ථාව යටතේ ක්‍රීඩා විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා අදහස් වේ;

"සේවා සැපයුම්කරු" යන්නෙන්-

(අ) පරිගණක පද්ධතියක් මාර්ගයෙන් හෝ ඉලෙක්ට්‍රොනික පද්ධතියක් මාර්ගයෙන් හෝ වෙනත් යම් මාර්ගයකින් සන්නිවේදනය කිරීමට තම සේවාදායකයන්ට හැකි වන පරිදි සේවාවක් සපයන හෝ පහසුකම් සලසන පොදු හෝ පෞද්ගලික ආයතනයක්; සහ

(ආ) ඒ ආයතනය වෙනුවෙන් හෝ එහි සේවාදායකයන් වෙනුවෙන් පරිගණක දත්ත හෝ තොරතුරු සකසන හෝ ගබඩා කරන වෙනත් යම් ආයතනයක්,

අදහස් වේ;

"ක්‍රීඩාව" යන්නට, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ කාර්ය සඳහා ක්‍රීඩාවක් වශයෙන් ලේකම්වරයා විසින් පිළිගනු ලබන ඕනෑම ආකාරයක ක්‍රීඩාවක්, තරගයක්, විනෝද ක්‍රීඩාවක්, ශාරීරික අභ්‍යාසයක්, කාය වර්ධන තරගයක් සහ අභ්‍යාසයක් ඇතුළත් වේ;

"ක්‍රීඩා ඉසව්ව" යන්නට, ජාතික මට්ටමේ හෝ ජාත්‍යන්තර මට්ටමේ වුව ද, යම් ක්‍රීඩාවක් හා සම්බන්ධ තරගයක්, තරගයක කොටසක්, තරග වාරයක්, ධාවන තරගයක් හෝ ක්‍රීඩාවක් හා සම්බන්ධ යම් ඉසව්වක් ඇතුළත් වේ;

"සේවාදායක තොරතුරු" යන්නෙන්, සේවා සැපයුම්කරුවකු විසින් පරිගණක දත්ත ආකාරයෙන් හෝ වෙනත් යම් ආකාරයකින් පවත්වා ගෙන යන එහි සේවාදායකයන්ට අදාළ යම් තොරතුරු අදහස් වේ; සහ

"හුවමාරු වන දත්ත" යන්නෙන්-

(අ) පරිගණක පද්ධතියක් මාර්ගයෙන් වූ සන්නිවේදනය කිරීමකට අදාළ;

(ආ) සේවා සැපයුම්කරුවකුගේ කොටසක් වන්නා වූ පරිගණක පද්ධතියක් මගින් උත්පාදනය කරන ලද; සහ

(ඇ) සන්නිවේදන ප්‍රභවය, ගමනාන්තය, මාර්ගය, කාලය, දත්ත, ප්‍රමාණය, කාලසීමාව හෝ සේවාදායක තොරතුරු පෙන්නුම් කරන,

දත්ත අදහස් වේ.

**41.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි ''ප්‍රකාශන පියස'' හි දී මිල දී ගත හැකි ය.